# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## ඉඩම් අමාත්‍යාංශය

# සැලසුම් ශිල්පී තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින සැලසුම් ශිල්පී තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර :- සැලසුම් ශිල්පී**

1.1 තනතුරු සංඛ්‍යාව :- 02

2. වැටුප් පරිමාණය :- 30,310/-300X10-350X7-495X4-660X20-50,940/-

2.1. මාසික මූලික වැටුප :- 30,310/-

3. වයස :- අවුරුදු 22 - 45 දක්වා

4. සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන් :-**

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල /දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව එක් වරක දී විෂයයන් 06කින් සමත් වී තිබීම.

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

4.3 **තාක්ෂණික නිපුණතා/ප්‍රවීණ**

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

5. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත්ද සහිතව 2021.04.05 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර ලුහුඬු ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරා ගතහොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.

8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සැලසුම් ශිල්පී තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

**සභාපති,**
**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,**
**අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2021.03.19**

Source: Dinamina, Daily News (2021.03.23)